කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2016/2017

**PSC - 3263 - දේශපාලන ආයතන පිළිබඳ තුලනාත්මක ප්‍රවේශයක්**

කාලය : පැය දෙකයි (02)

ප්‍රශ්න **තුනකට** (03) පමණක් පිළිතුරු සපයන්න.

**එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය විස්සකි (20).**

---

01. දේශපාලන නවීකරණයේ ස්වභාවය සහ එහි බලපෑම දකුණු ආසියානු රාජ්‍යවල ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය වෙත කර ඇති බලපෑම විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

02. ජනාධිපති සහ පාර්ලිමේන්තු යන මාදිලි දෙක අතුරින් මහජන ස්වාධිපත්‍යය වඩා හොඳින් නියෝජනය වන්නේ කවර ක්‍රමයකින්ද? තුලනාත්මකව විමසන්න.

03. නූතන දේශපාලන ක්‍රමයන් තුළ දේශපාලන පක්ෂ ඔබ හඳුනාගන්නේ කෙසේද? එක් එක් රාජ්‍යයන් තුළ ඇති දේශපාලන පක්ෂ ක්‍රමයන් සම්බන්ධයෙන් කර ඇති මූලික වර්ගීකරණයන් පිළිබඳව ඔබේ විවේචන මොනවාද?

04. (i) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ වර්ධනයේ පසුබිම කුමක්ද?, සහ ඔබ ලංකාවේ පක්ෂ ක්‍රමයේ මූලික ලක්ෂණ හඳුනාගන්නේ කෙසේද?

    (ii) පවතින දේශපාලන තත්වය යටතේ ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය තුළ කුමන ප්‍රවණතා ඔබට හඳුනාගත හැකිද?

05. ඉන්දියාවේ කොන්ග්‍රස් ව්‍යාපාරයේ වර්ධනය කෙටියෙන් සාකච්ඡා කරන්න. ඉන්දියාවේ පක්ෂ දේශපාලනය තුළ කොන්ග්‍රස් පක්ෂයේ වත්මන් තත්වය විවේචනාත්මකව විමසන්න.

06. 'නිළබල තන්ත්‍රය' පිළිබඳ ප්‍රධාන නිර්වචන කෙටියෙන් විමසන්න. රාජ්‍ය මට්ටමින් නිළබල තන්ත්‍රය කවර කාර්යභාරයක් ඉටු කරයිද?

**********************